---

**මිණිපේ ප්‍රාදේශීය සභාව**

**මහනුවර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 19 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මිණිපේ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) සභාවට අයත් ඉඩම් 07 ක වටිනාකම ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.**

**(ආ) කසළ කළමනාකරණ ඒකකය ඉදි කිරීමට අදාළ සහතික කළ කොන්ත්‍රාත් වැඩ වටිනාකම වූ රු.2,844,708 ක අගය ප්‍රාග්ධනිත කර නොතිබූ අතර, කොන්ත්‍රාත්කරුට ගෙවියයුතු වටිනාකම වූ රු.1,896,472 ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.**

**(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තත්කාර්යය අතුරු අග්‍රිම ගිණුමේ රු.39,846 ක බැර ශේෂයක් ඇති වීමට හේතු විගණනයට ඉදිරිපත් නොකරන ලදි.**

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

**අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.843,046 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.**

## 2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,125,548 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,176,074 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 683 | 671 | 393 |
| (ii) | බදු කුලී | 2,283 | 2,251 | 748 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 8,519 | 13,638 | -- |
| (iv) | වෙනත් ආදායම් | 3,873 | 6,789 | 2,270 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 296,583 |
| (ii) මුද්දර ගාස්තු | 390,000 |

**2.2.3 ජල ගාස්තු**

**-----------**

**සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල ගාස්තු හිගය රු.1,587,262 ක් වූ අතර, එය වර්ෂයේ බිල් කිරීම්වලින් 78% ක් පමණ විය.ජල සම්බන්ධතා ගිවිසුම්වල කොන්දේසි අංක iv අනුව, ජලය සඳහා එක් එක් මාසයේ ජල බිල්පත්වල සඳහන් මුදල ඊළග මාසයේ 15 දිනට පෙර සභාවට ගෙවියයුතුය. එසේ නොකිරීම මත ජල සම්බන්ධතා ගිවිසුම් අවලංගු කළයුතු වුවත්, 2012 වර්ෂය තුළ එබඳු කිසිදු ජල සම්බන්ධතාවයක් විසන්ධි කිරිමක් සිදු කර නොතිබුණි. ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන ලබන ජල යෝජනා ක්‍රම 06 හි ජල පාරිභෝගිකයින් 1486 දෙනෙකු සිටිය ද, ජල මීටර් අක්‍රීය වීම හේතු කොට ගෙන, ස්ථාවර ගාස්තු අය කරන පාරිභෝගික සංඛ්‍යාව 827 ක් විය. එය ජල පාරිභෝගිකයින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 56% කි. අක්‍රීය වී ඇති ජල මීටර නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරිම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.**

**2.3 නිශ්ක්‍රිය භෞතික සම්පත්**

**---------------------------**

**සභාව සතු රු.2,004,305 වටිනා වත්කම් කිසිදු කාර්යයක නොයොදා වර්ෂ 01 සිට 06 දක්වා කාලයක් නිෂ්ක්‍රිය තත්ත්වයේ පැවතුණි.**

**2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

**------------------------------**

**හසළක බස් නැවතුම් පළ අසළ පවත්වා ගෙන යනු ලබන සභාවට අයත් පොදු වැසිකිළිය 2007 වසරේ සිට 2013 ජුනි මස දක්වා ටෙන්ඩර් කර නොතිබු අතර, බාහිර පුද්ගලයකු විසින් රු.10 ක ගාස්තුවක් අය කරමින් වැසිකිළිය අනවසරයෙන් පවත්වා ගෙන යමින් තිබුණි. එමෙන්ම, සභාව සතු ජල යෝජනා ක්‍රමය මගින් ගාස්තුවක් අය නොකර, එම වැසිකිළිය සඳහා ජලය සපයා තිබු අතර, 2012 වර්ෂය සඳහා සභාව විසින් රු.17,520 ක මුදලක් වැසිකිළිය වෙනුවෙන් විදුලි ගාස්තු වශයෙන් ලංකා විදුලි බල මණ්ඩලය වෙත ගෙවා තිබුණි. මේ හේතුවෙන්, සභාවට අය වියයුතු ආදායමක් අහිමි වී තිබු බව නිරීක්ෂණය විය.**

**2.5** ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව 2012 වර්ෂය සඳහා රු.24,954 ක වියදමක් දරා දින පොත් 105 ක් මිල දී ගෙන තිබුණි.**

**2.6** අභ්‍යන්තර විගණනය

**ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.**

**3.** පද්ධති හා පාලන

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය

**(ඇ)** වත්කම් කළමනාකරණය

**(ඈ)** ණයහිමි පාලනය